KM4

PAÑÑAYA PARISUJJHATI

විශාඛා විද්‍යාලය, කොළඹ 5

තුන්වන වාර පරීක්ෂණය - 2015

ගණිතය I

10 ශ්‍රේණිය

කාලය : පැය 2 යි

361

නම / අංකය : ..............................................................................


## A කොටස

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.
(1 සිට 25 තෙක් සියලු ම ප්‍රශ්න සඳහා ලකුණු 2 බැගින් හිමි වේ.)

1) සීනි 250g ක මිල රු. 24 කි. සීනි $1\frac{1}{2}\,kg$ ක මිල අල 1kg ක මිලට සමාන වේ. අල 500g ක මිල සොයන්න.

2) $2x - 3y + x - 4y - 1$ සුළු කරන්න.

3) රූපයේ දී ඇති තොරතුරු ඇසුරින් $x$ හා $y$ සොයන්න.




4) රුපියල් 900 කට ගත් ඔරලෝසුවක් රුපියල් 1170 කට විකිණීමෙන් ලැබෙන ලාභ ප්‍රතිශතය සොයන්න.

5) $\frac{2-0.4}{0.08}$ සුළු කරන්න.

6) අරය r වන වෘත්තයක පරිධිය 22cm වේ නම් එහි අරය සොයන්න.

7) $\frac{5}{2x-3} + \frac{3}{3-2x}$ සුළු කරන්න.

8) (i) $\sqrt{7}$ කුමන වර්ග සංඛ්‍යා දෙක අතර පවතීද?

(ii) $\sqrt{7}$ හි පළමු සන්නිකර්ෂණය සොයන්න.

9) රුපියල් 1500 ක විදුලි බිලක් සඳහා 8% ක් VAT ලෙස අය කරන ලදී. VAT අයකල පසු විදුලි බිල සොයන්න.

10) සමාන්තර ශ්‍රේඩියක මුල් පද දෙක $-6$ හා $-11$ වේ.

(i) පොදු අන්තරය සොයන්න.

(ii) තුන්වන පදය සොයන්න.


11) $P = x\sqrt{a^2 + b^2}$ සූත්‍රයේ $a$ උක්ත කරන්න.

12) දිනකට පැය 6 බැගින් වැඩ කරන මිනිසුන් 4 දෙනෙකුට එක්තරා වැඩක් නිම කිරීමට දින 10 ක් ගත වේ. එම වැඩයට දිනකට පැය 8 බැගින් වැඩ කරන මිනිසුන් 5 දෙනෙකුට නිම කිරීමට ගතවන දින ගණන සොයන්න.

13) $2y = 3x - 2$ සරල රේඛාවේ අනුක්‍රමණය හා අන්තඃඛණ්ඩය සොයන්න.


14) වෙළෙන්දෙක් විකිණීම සඳහා ගෙන ආ අඹ ගෙඩි 132 කින් $\frac{5}{12}$ ක් විකුණන ලදී. එවිට ඉතිරි වූ අඹ ගණන සොයන්න.

15) රූපයේ දැක්වෙන සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය $x$ ඇසුරින් සුළු කර දක්වන්න.




16) $2^{-3} \times 2^{0}$ හි අගය සොයන්න.

17) රූපයේ දැක්වෙන ABC ත්‍රිකෝණය හා BCD ත්‍රිකෝණය අංගසම වේද? නොවේද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.




18) $a(3x-5)+7(5-3x)$ සාධක සොයන්න.

19) කොළඹ පිටකොටුව බස් නැවතුමෙන් සෑම පැය 3 කටම වරක් ත්‍රිකුණාමලයටද, සෑම පැය 4 කටම වරක් අම්පාරටද, සෑම පැය 6 කටම වරක් මඩකලපුවට ද බස් රථය බැගින් පිටත් වේ. එක්තරා දිනක පෙ.ව. 6.00 ට මෙම නගර 3 නටම එකවර බස්රථය බැගින් පිටත් විය. නැවත මෙම නගර තුනටම එකවර බස් රථය බැගින් පිටත් වීමට ගතවන කාලය සොයන්න. එවිට වේලාව කීයද?


20) $4x^2 = 6x$ වර්ගජ සමීකරණයේ විසඳුම් සොයන්න.

21) $log_x^{64} = 3$ නම් $x$ හි අගය සොයන්න.

22) $20ms^{-1}$ ක වේගයෙන් ගමන් කරන දුම්රියක වේගය පැයට කිලෝමීටර් වලින් සොයන්න.

23) $x \geq -1$ හා $y < 3$ යන අවස්ථාවලින් දැක්වෙන ප්‍රදේශ දෙකටම අයත් වූ ලක්ෂ්‍යයක ඛණ්ඩාංක ලියන්න.

24) O කේන්ද්‍රය වූ වෘත්තයේ BC විෂ්කම්භයකි. A, D, E පරිධිය මත පිහිටා ඇත. $x$ හා $y$ සොයන්න.




25) $\frac{8}{x^2} - \frac{9}{y^2} = 1$ වන පරිදි $x$ ට හා $y$ ට ගත හැකි ධන නිඛිල 2 ක් ලියන්න.


To download past papers visit
www.vajirapani.blogspot.com



To download past papers visit
www.vajirapani.blogspot.com

## ගණිතය I - B කොටස

- ප්‍රශ්න සියල්ලට ම මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.
(එක් එක් ප්‍රශ්නයට ලකුණු 10 බැගින් ලැබේ.)

(1) (a) සුළු කරන්න. $\left(2\frac{1}{12} - 1\frac{7}{8}\right) \div \frac{5}{6}$

(b) නගරයක සිටින ජනගහණයෙන් $\frac{4}{15}$ ක් වයස අවුරුදු 50ට වැඩිය. ඉතිරියෙන් $\frac{6}{11}$ ක් වයස අවුරුදු 20 සිට 50 තෙක් අය වේ. ඉතිරි සියල්ලක් වයස අවුරුදු 20ට අඩු වේ.


(i) 20 සිට 50 තෙක් වයසේ සිටින්නන් මුළු ජනගහණයෙන් භාගයක් ලෙස ලියන්න.

(ii) වයස 20ට අඩු පිරිස මුළු ජනගහණයෙන් භාගයක් ලෙස ලියන්න.

(iii) වයස 20ට අඩු ජනගහණය 7200 ක් නම් නගරයේ සිටින මුළු ජනගහණය සොයන්න.

(iv) වයස අවුරුදු 20 සිට 50 තෙක් ජනගහණය සොයන්න.

(2) දිග 24cm ද, පළල 21cm ද වූ සෘජුකෝණාස්‍ර ලෝහ තහඩුවකින් රූපයේ ආකාරයට සෘජුකෝණික ත්‍රිකෝණාකාර කොටසක් හා අරය 21cm වූ කේන්ද්‍රික ඛණ්ඩයක් කපා ඉවත් කර ඇත. කේන්ද්‍රික ඛණ්ඩයේ කෝණය $60^0$ කි.




(i) ඉහත සෘජුකෝණික ත්‍රිකෝණ කොටස හා කේන්ද්‍රික ඛණ්ඩය කපා ඉවත් කල පසු ඉතිරි වූ කොටසේ පරිමිතිය සොයන්න.

(ii) තහඩුවේ ඉතිරි වූ කොටසේ වර්ගඵලය සොයන්න.

(iii) ඉහත කපාගත් කේන්ද්‍රික ඛණ්ඩයේ වර්ගඵලයට සමාන වර්ගඵලයක් සහිත සෘජුකෝණාස්‍ර තහඩු කැබැල්ලක් AB දිග වන සේ ඉහත කේන්ද්‍රික ඛණ්ඩ AB දාරයට පාස්සා ගන්නා ලදී. ලැබෙන සෘජුකෝණාස්‍රයේ පළල සොයන්න.

(3) (a) නගරයක සිටින ජනගහනයෙන් 4800 ක් සිංහලද, 3600 ක් මුස්ලිම්ද වේ.

(i) එහි සිටින සිංහල හා මුස්ලිම් ජනවර්ගයන් අතර අනුපාතය ලියා එය සරලම ආකාරයෙන් දක්වන්න.

(ii) එහි සිටින සිංහල, දෙමළ හා මුස්ලිම් අතර අතර සරලම අනුපාතය 8 : 3 : 6 වේ නම් එහි සිටින දෙමළ මිනිසුන් ගණන සොයන්න.

(b) වසර 3 ක් අවසානයේදී රුපියල් 31000 ක් ගෙවා ණයෙන් නිදහස්වීමේ පොරොන්දුව පිට සුරංගි සුළු පොලියට යම් මුදලක් ණයට ගන්නා ලදී. නමුත් ඇයට වසර 3 කින් මෙම ගනුදෙනුව අවසන් කළ නොහැකි වීම නිසා මෙම ගනුදෙනුව වසර 5 ක් දක්වා දීර්ඝ විය. වසර 5 කට පසු ඇය රුපියල් 35000 ක් ගෙවා ණයෙන් නිදහස් විය.


To download past papers visit
www.vajirapani.blogspot.com

(i) වසරක් සඳහා ඇය ගෙවූ පොලිය සොයන්න.

(ii) ඇය ණයට ගත් මුදල සොයන්න.

(iii) ණය මුදල සඳහා අය කළ වාර්ෂික පොලී ප්‍රතිශතය සොයන්න.

(4) ළමුන් පිරිසකගෙන් චාරිකාවක් යාම සඳහා වඩාත් කැමති ප්‍රදේශය අසා ලබාගත් තොරතුරු ඉහත වට ප්‍රස්ථාරයේ දැක්වේ.




(i) නුවරඑළියේ යාමට කැමැත්ත දැක් වූ ළමුන් දැක්වෙන කෝණය සොයන්න.

(ii) ත්‍රිකුණාමලයේ යාමට කැමැත්ත දැක් වූ ළමුන් ගණන 12 ක් නම් අනුරාධපුරයට යාමට කැමැත්ත දැක්වූ ළමුන් ගණන සොයන්න.


(iii) චාරිකාව යාමට කැමැත්ත දැක්වූ මුළු ළමුන් ගණන සොයන්න.

(iv) ගාල්ලේ යාමට කැමැත්ත දැක් වූ සියළු ළමුන් නුවරඑළියේ යාමට එකඟ වූයේ නම් එවිට නුවරඑළියේ යාමට කැමැත්තක් දැක්වූ මුළු ගණන සොයන්න.

(v) එවිට අනුරාධපුරයේ යාමට කැමති වූ ළමුන් ගණන නුවරඑළියේ යාමට කැමැත්ත දැක්වූ මුළු ළමුන්ගේ ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

(5) (a) පෑන් පෙට්ටියක් තුළ එකම වර්ගයේ හා එකම ප්‍රමාණයේ නිල් පෑන් 3 ක් $B_1$, $B_2$, $B_3$ ද, රතු පෑන් 2 ක් $R_1$, $R_2$ ද, කොළ පෑන් 1ක් ලෙසද නම් කර ඇත. ඒවා සියල්ල හොඳින් මිශ්‍ර කර අහඹු ලෙස එයින් පෑනක් ඉවතට ගනු ලැබේ. එහි වර්ණය සටහන් කර එය ආපසු පෑන් පෙට්ටිය තුළට දමා හොඳින් මිශ්‍ර කර නැවතත් පෑනක් ගනු ලැබේ.

(i) විය හැකි සිදුවීම් දක්වන නියැදි අවකාශය කොටු දැලක දක්වන්න.



(ii) අවස්ථා දෙකේදීම එකම පැන ලැබීමේ සම්භාවිතාව සොයන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

(iii) වාර දෙකේදීම එකම වර්ණයේ පෑනක් ලැබීමේ සම්භාවිතාව සොයන්න.


(iv) පළමුව නිල් පෑනක් ලැබී දෙවනුව රතු පෑනක් ලැබීමේ සම්භාවිතාව සොයන්න.

(v) එක් වරක්වත් කොළ පෑනක් ලැබීමේ සම්භාවිතාව සොයන්න.

(vi) ඉහත (ii), (iii) සිද්ධීන් අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර වේද? නොවේද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

(b) ප්‍රසාදි විභාගය සමත්වීමේ සම්භාවිතාව $\frac{5}{6}$ ක්ද, මිලානි එම විභාගයම සමත්වීමේ සම්භාවිතාව $\frac{9}{10}$ ක් ද වේ.

❖ ප්‍රසාදි විභාගය සමත්වීම අසමත්වීම හා මිලානි විභාගය සමත්වීම අසමත්වීම දැක්වෙන සේ ඇඳි අසම්පූර්ණ රුක් සටහනක් පහත දැක්වේ.




(i) p හා q ට අදාළ සම්භාවිතාවන් සොයන්න.

(ii) දෙදෙනාම සමත්වීමේ සම්භාවිතාව සොයන්න.

(iii) එක් අයෙකු පමණක් සමත්වීමේ සම්භාවිතාව සොයන්න.

PAÑÑAYA PARISUJJHATI

විශාඛා විද්‍යාලය, කොළඹ 5

360

තුන්වන වාර පරීක්ෂණය - 2015

ගණිතය II

10 ශ්‍රේණිය

කාලය : පැය $2\frac{1}{2}$යි

නම / අංකය : ..............................

- A කොටසින් ප්‍රශ්න පහකුත්, B කොටසින් ප්‍රශ්න පහකුත් තෝරාගෙන ප්‍රශ්න දහයකට පමණක් පිළිතුරු සපයන්න.

## A කොටස

(ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.)

(1) (a) කඩ කාමරයක තක්සේරු වටිනාකමින් 4.5% ක් වාර්ෂික වරිපනම් බදු ලෙස ගෙවිය යුතු වේ. කාර්තුවකට ගෙවිය යුතු වරිපනම් මුදල රුපියල් 585 ක් නම්,

(i) වර්ෂයකට ගෙවිය යුතු වරිපනම් මුදල සොයන්න.

(ii) කඩ කාමරයේ තක්සේරු වටිනාකම සොයන්න.

(b) වෙළෙන්දෙක් පා පැදියක් රුපියල් 4200 කට ආනයනය කරන ලදී. එම මිලෙන් 40% ක් තීරු ගාස්තු ලෙස ගෙවන ලදී.

(i) ගෙවන ලද තීරු ගාස්තුව සොයන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

(ii) ඔහු තීරු බදු ගෙවූ පසු එම පා පැදිය රුපියල් 7350 කට විකුණන ලදී. ඔහුට ලැබුණු ලාභ ප්‍රතිශතය සොයන්න.

(2) $y = 3 - x^2$ ශ්‍රිතයේ ප්‍රස්ථාරය ඇඳීම සඳහා සකස් කළ අසම්පූර්ණ වගුවක් පහත දැක්වේ.

| $x$ | $-3$ | $-2$ | $-1$ | $0$ | $1$ | $2$ | $3$ |
|---|---|---|---|---|---|---|---|
| $y$ | $-6$ | $-1$ | ........ | $3$ | $2$ | $-1$ | $-6$ |

(i) $x = -1$ වන විට $y$ හි අගය සොයන්න.

(ii) $x$ හා $y$ අක්ෂ කුඩා බෙදුම් 10 කින් ඒකක එකක් වන සේ පරිමාණය ගෙන ඉහත ශ්‍රිතයේ ප්‍රස්ථාරය අඳින්න.

(iii) ප්‍රස්ථාරය භාවිතයෙන් ශ්‍රිතයේ උපරිම අගය සොයන්න.

(iv) ශ්‍රිතයේ අගය ධන වන $x$ හි අගය පරාසය සොයන්න.

(v) ඉහත ශ්‍රිතය මත $y = x$ රේඛාව ඇඳ එම රේඛාවෙන් වක්‍රයත් ඡේදනය වන ලක්ෂ්‍යවල $x$ ඛණ්ඩාංක ලියා දක්වන්න.

(3) (a) $\frac{5}{2(x-1)} - \frac{4}{3(x-1)} = \frac{1}{6}$ සුළු කරන්න.

(b) "සාමා" පලතුරු වෙළඳ සැලකින් අඹගෙඩි 3 ක් හා ඇපල් ගෙඩි 2 ක් මිලදී ගැනීම සඳහා රුපියල් 85 ක් ගෙවන ලදී. අඹගෙඩි 4 ක මිල ඇපල් ගෙඩි 3 ක මිලට සමාන වේ.

(i) අඹගෙඩියක මිල x ද, ඇපල් ගෙඩියක මිල y ද, ලෙස ගෙන මෙම තොරතුරු දැක්වීමට සමගාමී සමීකරණ යුගලයක් ගොඩ නගන්න.

(ii) ඒවා විසඳීමෙන් අඹගෙඩියක මිලත් ...

(4) තිරස් පොළවට 4m ලම්බ උසින් පිහිටි සිරස් ගොඩනැගිල්ලක මුදුනේ සිටින්නකුට එම ගොඩනැගිල්ලට කිසියම් තිරස් දුරකින් පිහිටි ඊට වැඩි උසකින් යුත් වෙනත් ගොඩනැගිල්ලක මුදුන $40^0$ ක ආරෝහණ කෝණයකින්ද, එම ගොඩනැගිල්ලේ පාමුල $30^0$ ක අවරෝහණ කෝණයකින්ද දිස්වේ.

(i) දළ සටහනක් ඇඳ ඉහත දත්ත ලකුණු කරන්න.

(ii) සුදුසු පරිමාණයක් ගෙන ඉහත තොරතුරු දැක්වීමට පරිමාණ රූපයක් අඳින්න.

(iii) එය ඇසුරින් ගොඩනැගිල්ලේ සැබෑ උස සොයන්න.

(iv) ගොඩනැගිලි දෙක අතර තිරස් දුර සොයන්න.

(5) (a) ලඝුගණක වගු භාවිතා නොකර අගය සොයන්න.

$$log_{10}125 + log_{10}2 + log_{10}16$$

(b) $x$ හි අගය සොයන්න.


$$log_a x + log_a 6 = log_a 18 - log_a 3$$

(c) $log_3 4 = x$ නම් $log_3 12$ සොයන්න.

(d) ලඝුගණක වගු භාවිතයෙන් පමණක් අගය සොයන්න.

$$\frac{1200}{9.673 \times 37.6}$$

(6) (a) රූපයේ දැක්වෙන්නේ අරය r හා උස h වූ ඝන සිලින්ඩරයකි. එහි පතුලේ වර්ගඵලය $154cm^2$ වන අතර එහි උස පතුලේ අරය මෙන් හතර ගුණයකි.




(i) පතුලේ අරය සොයන්න.


(ii) සිලින්ඩරයේ උස සොයන්න.

(iii) මුළු පෘෂ්ඨ වර්ගඵලය සොයන්න.

(iv) පරිමාව සොයන්න.

(පතුලේ අරය r ද, උස h වන සිලින්ඩරයක පතුලේ වර්ගඵලය $\pi r^2$ ද, වක්‍ර පෘෂ්ඨයේ වර්ගඵලය $2\pi rh$ ද, පරිමාව $\pi r^2 h$ ද ලෙස ගන්න.)

(b) රූපයේ දැක්වෙන ප්‍රිස්මයේ දී ඇති තොරතුරු ඇසුරින්,




(i) මුළු පෘෂ්ඨ වර්ගඵලය සොයන්න.

(ii) පරිමාව සොයන්න.

## B කොටස

**(ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.)**

(7) (a) සමාන්තර ශ්‍රේඪියක n වෙනි පදය $T_n = 13 - 7n$ වේ.

(i) එහි මුල් පද 3ක ලියන්න.

(ii) 15 වන පදය සොයන්න.

(iii) $-64$ වන්නේ කීවෙනි පදයද?

(b) 50 ත් 200 ත් අතර 7 හි ගුණාකාර වල එකතුය සොයන්න.

---

(8) (i) $AB = 8cm$ ද, $B\hat{A}C = 75^0$ ද, $AC = 5cm$ ද වන $B\hat{A}C$ නිර්මාණය කරන්න.

(ii) C හරහා AB ට සමාන්තර රේඛාවක් නිර්මාණය කරන්න.

(iii) $AX = 8cm$ වන සේ ඉහත ඇඳි සමාන්තර රේඛාව මත X ලක්ෂය ලකුණු කරන්න.

(iv) BAXY රොම්බසය නිර්මාණය කරන්න.

(v) $B\hat{A}X$ ට සමාන කෝණ දෙකක් නම් කරන්න. හේතු දක්වන්න.

(vi) $X\hat{A}C$ අගය මැන ලියන්න.

---

(9) විවිධ වාහන වර්ග 100 ක් යොදා ගනිමින් කරන ලද සමීක්ෂණයක්ද ඒවා පෙට්‍රල් $1l$ කින් ධාවනය කළ හැකි දුර ආසන්න කිලෝමීටරයට ගෙන සකස් කල වගුවක් පහත දැක්වේ.

| $1l$ කින් යා හැකි දුර | 5-10 | 10-15 | 15-20 | 20-25 | 25-30 | 30-35 | 35-40 |
|---|---|---|---|---|---|---|---|
| වාහන ගණන | 8 | 12 | 22 | 24 | 18 | 10 | 6 |

(i) මාත පන්තිය කමක්ද?

To download past papers visit
www.vajirapani.blogspot.com

(ii) මාත පන්තියේ මධ්‍ය අගය උපකල්පිත මධ්‍යනය ලෙස ගෙන වාහනයක් පෙට්‍රල් $1l$ කින් ධාවනය කළ හැකි දුර ආසන්න කිලෝමීටරයට සොයන්න.

(iii) මේ අනුව 286km දුරක් ධාවනය වන වාහනයකට අවශ්‍ය ඉන්ධන ලීටර් ගණන ඉහත මධ්‍යනය ඇසුරින් සොයන්න.

(iv) පෙට්‍රල් $1l$ ක මිල රු. 135 ක් නම් ඉහත වාහනයට එම ඉන්ධන ලබා ගැනීම සඳහා වැයවන මුදල සොයන්න.

---

(10) (a) පන්තියක සිටින ළමුන් 48 දෙනෙකුගෙන් ගණිතයට හා විද්‍යාවට ලබා ගත් ලකුණු පිළිබඳව කරන ලද සමීක්ෂණයකදී එම ළමුන්ගෙන් 21 ක් ගණිතයට ලකුණු 50 ට වැඩියෙන්ද 37 ක් විද්‍යාවට ලකුණු 50ට වැඩියෙන්ද ලබා තිබුණි. ගණිතයට ලකුණු 50ට වැඩියෙනලැබූ ළමුන් සියල්ල විද්‍යාවටද ලකුණු 50ට වැඩියෙන් ලබා තිබුණි.

(i) ගණිතය M ද, විද්‍යාව S ද ලෙස ගෙන මෙම M හා S කුලක අතර සම්බන්ධය කුලක අංකනයෙන් ලියා දක්වන්න.

(ii) ඉහත තොරතුරු දැක්වීමට වෙන් රූප සටහනක් අඳින්න.

(iii) එය ඇසුරින් පමණක් විෂයන් දෙකටම ලකුණු 50ට අඩුවෙන් ලැබූ ළමුන් ගණන සොයන්න.

(iv) $M' \cap S$ ප්‍රදේශය ඉහත වෙන් රූපයේම අඳුරු කර දක්වන්න. එම ප්‍රදේශයට අයත් ළමුන් පිළිබඳව වචනයෙන් විස්තර කර ලියන්න.

---

(11) (a) "සමාන්තරාස්‍රයක"


(i) සම්මුඛ පාද සමාන වේ.

(ii) සම්මුඛ කෝණ සමාන වේ.

(iii) විකර්ණ මගින් වර්ගඵලය සමච්ඡේදනය වේ.

ඉහත ප්‍රමේය රූප සටහනක් ඇඳ විධිමත්ව සාධනය කරන්න.


(b)




ඉහත රූපයේ ABCD සමාන්තරාස්‍රයකි. එහි AB = AR ද වන අකර CD = DP වන සේ CD පාදය P තෙක් දික්කර ඇත. PQ//AR වනසේ AD පාදය Q තෙක් දික්කර ඇත. PQRA චතුරස්‍රය සමාන්තරාස්‍රයක් බව සාධනය කරන්න.

---

(12) (අ) රූපයේ O කේන්ද්‍රය වූ වෘත්තයේ AB විශ්කම්භයකි. AC හා BC ජ්‍යායන් දිගින් සමාන වන අතර O කේන්ද්‍රයේ සිට ACට ඇඳි ලම්භය OX ද, BC ට ඇඳි ලම්භය OY ද වේ.




(i) AX = YB බව සාධනය කරන්න.

(ii) $AXO\Delta \equiv BOY\Delta$ බව සාධනය කරන්න.

(iii) OYCX සමචතුරස්‍රයක් බව

(iv) $A\hat{D}C$ හි අගය සොයන්න. ඒ සඳහා ඔබ යොදාගත් ප්‍රමේය සඳහන් කරන්න.